# හවුල් ව්‍යාපාර

ලූකා පැසියෝලිගේ දෙවන පරපුර ...

**ගයාන් දිලීප**

**Weekly paper 01**

1. හවුල් ව්‍යාපාරයක් පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය නොවන කොන්දේසිය කුමක් ද ?.

   I. ලාභය අරමුණ
   II. පුද්ගලයින් සිටීම
   III. ව්‍යාපාර කටයුත්තක් පැවතීම
   IV. හවුල් ගිවිසුම
   V. හවුල් ඔප්පුව

2. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක හවුල් ගිවිසුමේ පවතින තොරතුරු කිහිපයකි.

   A. ලාභය හෝ අලාභය බෙදා ගන්නා අනුපාතය
   B. ප්‍රාග්ධනයට අමතරව සපයන ණය සඳහා වන පොළීය
   C. විශ්‍රාම යන හවුල්කරුවන්ට නොගෙවූ ශේෂය මත හිමිවන පොළිය
   D. ප්‍රාග්ධනයට අමතරව සපයන ණය සඳහා හිමිවන පොළිය.

   1890 හවුල් ව්‍යාපාර ආඥාපනතේ 24 වැනි වගන්තියට අනුකූල ප්‍රකාශන / ප්‍රකාශ මොණවා ද ?.

   I. A,B සහ C පමණි.
   II. A,B සහ D පමණි.
   III. B,C සහ D පමණි.
   IV. C සහ D පමණි.
   V. A,B සහ D පමණි.

3. පහත දැක්වෙන ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශන මොණවා ද ?.

   A. හවුල් ව්‍යාපාරයක සිටිය යුතු අවම හා උපරිම සාමාජික සංඛ්‍යාව - 2007 අංක 07 දරන සාමාගම් පනත.
   B. රු. 1 000 ට වැඩි ආරම්භක ප්‍රාග්ධනයක් සහිත සියළුම ව්‍යාපාර ලිඛිත ගිවිසුමක් මත පවත්වා ගැනීම. - 1840 අංක 07 දරන වංචා වැලැක්වීමේ ආඥාපනත.
   C. ගානර් එදිරිව මරේ නඩු තීන්දුව - බුන්වත්වූ හවුල්කරුගේ අවාසිදායක ශේෂය නුබුන්වත් හවුල්කරුවන් විසින් ප්‍රාග්ධන අනුපාතයට විද ගැනීම.

   සත්‍ය ප්‍රකාශ / ප්‍රකාශන මොණවා ද ?.

   I. A පමණි.
   II. B පමණි.
   III. C පමණි.
   IV. A සහ B පමණි.
   V. A,B සහ C පමණි.

4. ව්‍යාපාරයක හිමිකම් ගිණුමක් නොවන්නේ මින් කුමක් ද ?.

   I. ප්‍රාග්ධන හා ගැණිලි ගිණුම
   II. ප්‍රාග්ධන හා ජංගම ගිණුම
   III. සමුච්චිත අරමුදල් ගිණුම
   IV. සාමාන්‍ය කොටස් හා සංචිත ගිණුම
   V. ඉහත කිසිවක් නොවේ.

5. හවුල් ව්‍යාපාරයක් සම්බන්ධව අයිතම කිහිපයක් පහත පරිදි දක්වා ඇත.

A. හවුල් වේතන

B. ප්‍රාග්ධනයට අමතරව සපයන ණය සඳහා වන පොළිය

C. හවුල්කරුවෙකු විසින් සපයා ඇති ගොඩනැගිල්ල සඳහා වන වාර්ෂික කුළිය.

D. ප්‍රාග්ධන පොළිය

මම ප්‍රකාශ / ප්‍රකාශන අතරින් ලාභ අලාභ විසර්ජන ප්‍රකාශයේ පමණක් ඇතුලත් කරන ප්‍රකාශන මොණවා ද ?.

I. A සහ B පමණි.
II. A සහ C පමණි.
III. A,B සහ C පමණි.
IV. B,C සහ D පමණි.
V. A සහ D පමණි.

6. හවුල් ව්‍යාපාරයක් 2018.03.31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව පිළියෙල කරන ලද ශුද්ධ ලාභය රු. 2 420 000 ක් විය. පසුව පහත වැරදි හඳුනා ගන්නා ලදි.

- හවුල්කරුවෙකු විසින් සපයා අති ණය සඳහා අදාල වන පොළිය රු. 800 000 ක් මෙතෙක් ගෙවා නොමැති නිසා ගිණුම් තබා නොමැත.
- ණයගැති ශේෂයෙන් රු. 100 000 ක් බොල්ණය ලෙස කපාහැරිය යුතුය.
- හවුල් කරුවෙකු සඳහා අදාල වන රු. 60 000 ක ප්‍රාග්ධන පොළිය ගිණුම ගතකර නොමැත.

වැරදි නිවැරදි කිරීම නිසා නිවැදි ශුද්ධ ලාභය සහ හවුල් ව්‍යාපාරයේ නිවැරදි හිමිකමේ වටිනාකම වන්නේ,

| | නිවැරදි ශුද්ධ ලාභය | හිමිකමේ වෙනස |
|---|---|---|
| I. | රු. 1 460 000 | 900 000 කින් අඩු වේ. |
| II. | රු. 1 520 000 | 100 000 කින් වැඩි වේ. |
| III. | රු. 1 620 000 | 700 000 කින් වැඩි වේ. |
| IV. | රු. 1 580 000 | 900 000 කින් වැඩි වේ. |
| V. | රු. 2 320 000 | 160 000 කින් අඩු වේ. |

පහත තොරතුරු යොදාගෙන ප්‍රශ්න අංක 7 සිට 10 දක්වා පිළිතුරු සපයන්න.

ජංගම ගිණුම රු. "000"

| | A | B | C | | A | B | C |
|---|---|---|---|---|---|---|---|
| අලාභ කොටස් | 120 | 60 | 60 | ඉ. ශේෂය | 600 | 400 | 200 |
| ගැණිලි | 200 | 300 | 120 | ප්‍රාග්ධන පොළී (10%) | 80 | 120 | 100 |
| | | | | හවුල් වේතන | 400 | 200 | 100 |
| | | | | ණය පොළිය (5%) | | 20 | |
| ශේෂය ප.ගේ | 760 | 380 | 220 | | | | |
| | **1,080** | **740** | **400** | | **1,080** | **740** | **400** |

7. හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වන්නේ,

I. රු. 1 460 000 කි.
II. රු. 2 220 000 කි.
III. රු. 1 020 000 කි.
IV. රු. 760 000 කි.
V. රු. 1 240 000 කි.

8. ඉහත හවුල් ව්‍යාපාරය සම්බන්ධව වන අසත්‍ය ප්‍රකාශය කුමක් ද ?.

I. ලාභ අලාභ A,B සහ C විසින් 2:2:1 අනුපාතයට බෙදාගනී.

II. ප්‍රාග්ධන ශේෂය මත වාර්ෂිකව 10% පොලියක් හිමි වේ.

III. හවුල් වේතන පිළිවලින් රු. 400 000 , රු. 200 000 ක් හා රු. 100 000 ක් A, B හා **C** හිමි වේ.

IV. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ශේෂයන පිළිවලින් A,B සහ C රු. 80 000, රු. 120 000 ක් සහ රු. 100 000 ක් වේ.

V. ප්‍රාග්ධනයට අමතරව සපයන ණය සදහා වාර්ෂිකව 5% පොළියක් හිමි වේ.

9. ඉහත හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරුවන්ගේ කාලච්ජේද අවසාන මුළු හිමිකම දක්වෙන පිළිතුර වන්නේ,

| | A | B | C |
|---|---|---|---|
| I. | 600 000 | 400 000 | 200 000 |
| II. | 580 000 | 520 000 | 300 000 |
| III. | 1 300 000 | 1 600 000 | 1 200 000 |
| IV. | 1 560 000 | 1 580 000 | 1 220 000 |
| V. | ඉහත කිසිවක් නොවේ. | | |

10. **B** හවුල්කරු ඔහුට අයිති සියළුම වටිනාකම ව්‍යාපාරයේ ඉල්ලුම් කරයි නම්. කාලච්ජේදය අවසාන දිනට ඔහුට ගෙවිය යුතු වටිනාකම ගණනය කරන්න.

I. රු. 380 000

II. රු. 320 000

III. රු. 1 980 00

IV. රු. 1 600 000

V. රු. 1 540 000

11. 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සදහා හවුල් ව්‍යාපරය ඒකාකාරීව උපයන ලද ශුද්ධ ලාභය රු. 3 600 000 කි.ආරම්භයේ සිට අමිල හා බානුක විසින් 2 : 1 ට ලාභ අලාභ බෙදාගත් අතර 2017.12.31 දින නව හවුල්කරුවෙක් ලෙස චානුක ව්‍යාපාරයට එක් විය. චානුකගේ බඳවා ගැනීමෙන් පසුව 2 : 2 : 1 අනුපාතයට අමිල, බානුක සහ චානුක ලාභ බෙදා ගන්නා ලදි.

| | අමිල | බානුක | චානුක |
|---|---|---|---|
| I. | රු. 2 160 000 | 1 260 000 | 180 000 |
| II. | රු. 1 440 000 | 1 440 000 | 720 000 |
| III. | රු. 2 400 000 | 1 200 000 | - |
| IV. | රු. 1 800 000 | 900 000 | 900 000 |
| V. | ඉහත කිසිවක් නොවේ. | | |

12. රංග විසින් 2017.10.01 දින හවුල් ව්‍යාපාරය සදහා ප්‍රාග්ධනයට අමතගරව සපයන ලද ණය මුදල රු. 1 400 000 ක් විය. හවුල් ගිවිසුම තුළ ණය මුදල් සම්බන්ධව කිසිදු කොන්දේසියක් ඇතුලත් නොවූ අතර ණය

පොළිය මෙතෙක් ගෙවා නොමැත.ඉහත ගනු දෙනුව 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සටහන් කරන ද්විත්ව සටහන වන්නේ,

| | | | | |
|---|---|---|---|---|
| I. | ණය පොළී වියදම් ගිණුම | හර | 70 000 | |
| | ජංගම ගිණුම | | | 70 000 |
| II. | ණය පොළී වියදම් ගිණුම | හර | 35 000 | |
| | ජංගම ගිණුම | | | 35 000 |
| III. | ණය ගිණුම | හර | 70 000 | |
| | ගෙවිය යුතු පොළී | | | 70 000 |
| IV. | ණය පොළී වියදම් ගිණුම | හර | 140 000 | |
| | මුදල් ගිණුම | | | 140 000 |

V. ඉහත කිසිවක් නොවේ.

13.පහත ගනු දෙනු අතරින් හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකමට බලපෑමක් ඇති නොකරන පිළිතුර වන්නේ,

A. නොගෙවා ඇති හවුල්කරුවන්ගේ ණය පොළි සටහන් කිරීම

B. ලාභ කොටස් මුදලින් ගෙවීම

C. හවුල්කරුවෙකු විසින් සපයා ඇති ගොඩනැගිල්ල සඳහා නොගෙවා ඇති කුළිය

D. අලාභ කොටස් ලාභයෙන් විසර්ජනය කිරීම.

I. A සහ B පමණි

II. A සහ C පමණි

III. A,C සහ D පමණි

IV. A,B සහ D පමණි

V. A,B,C සහ D පමණි

14.හවුල් ව්‍යාපාරයකට අදාලව පහත තොරතුරු සපයා ඇත.

| | 2018.03.31 | 2017.04.01 |
|---|---|---|
| ජංගම ගිණුම් ශේෂය | 2 460 000 | 1 940 000 |
| ප්‍රාග්ධන ගිණුම් ශේෂය | 4 600 000 | 4 000 000 |
| රදවාගත් ඉපයුම් (සංචිතය) | 300 000 | - |
| ණය ගිණුම | 600 000 | 400 000 |

- සියළු ගැණිලි වටිනාකම රු. 500 000 නියමිත පරිදි ගිණුම ගතකර ඇත.
- යොදවන ලද අමතර ප්‍රාග්ධනය රු. 600 000 ක් විය.

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය විසින් උපයා ඇති ශුද්ධ ලාභය ගණනය කරන්න.

I. රු. 520 000

II. රු. 720 000

III. රු. 1 220 000

IV. රු. 620 000

V. රු. 500 000

15.හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය ගණනය කරන අවස්ථා මොණවා ද ?.

………………………………… …………………………………

**071 26 16 609**